# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயற்திறன் அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

## 2019



**Head No: 265**



ඇමුණුම :I

# පටුන

1. 01 වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය


1.1. හැඳින්වීම ........ 01
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු ........ 04
1.3. ප්‍රධාන කාර්යයන් ........ 05
1.4. සංවිධාන සටහන ........ 07
1.5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල ........ 08
1.6. අරමුදල් ........ 08
1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ........ 08


2. 02 වන පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම


2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක ........ 09


3. 03 වන පරිච්ඡේදය – සමස්ත මූල්‍ය කාර්ය සාධනය - 2019 වර්ෂය


3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ........ 11
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 12
3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ........ 13
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් ........ 14
3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ........ 15
3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........ 16
3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ........ 17
3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය. ........ 19
3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව ........ 20

4. 04 වන පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක ............................................................ 28

5. 05 වන පරිච්ඡේදය– තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න .......................... 29

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න ........................................................................... 42

6. 06 වන පරිච්ඡේදය– මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය ............................................................ 44

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය ........................................................................... 44

6.3. මානව සම්පත් සංවර්ධනය. ........................................................................ 45

7. 07 වන පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව..................................................... 46

# 1. 01 වන පරිච්ඡේදය – ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. හැඳින්වීම

### දිස්ත්‍රික්කයේ පිහිටීම

පිහිටීම :- මන්නාරම දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ වයඹ දිශාවට හුරුව පිහිටා ඇති අතර එය දූපතකින් සහ දිස්ත්‍රික්කයේ සෙසු ප්‍රදේශවලින් සමන්විතවේ. මෙම දිස්ත්‍රික්කය කිලිනොච්චි, මුලතිව්, වවුනියා, අනුරාධපුර සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වලට මායිම්ව පිහිටා ඇත. ප්‍රධාන භූමිය සහ දූපත යා කෙරෙන වෙලි මගක් පවතී. දිස්ත්‍රික්කයේ සමස්ත භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 2,002 ක් වන අතර මෙහි පිහිටි මඩු, මන්නාරම නගරය, මාන්තෙයි බටහිර, මුසලි සහ නානාට්ටාන් යන ප්‍රදේශීය ලේකම් කාර්යාල සහ මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මකව පවතී.






## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් භූමි ප්‍රමාණය

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ප්‍රමාණය | |
|---|---|---|
| | වර්ග කි.මී. | ප්‍රතිශතය |
| මන්නාරම නගරය | 226.88 | 11.33 |
| නානාට්ටාන් | 129.25 | 6.46 |
| මුසලි | 474.22 | 23.69 |
| මාන්තෙයි බටහිර | 658.90 | 32.91 |
| මඩු | 512.82 | 25.61 |
| එකතුව | **2,002.07** | **100.00** |

## දිස්ත්‍රික්කයේ ආර්ථික හා ජීවනෝපාය තත්වයන්

- **වී වගාව**
- **ධීවර කර්මාන්තය**
- වැවිලි

## දිස්ත්‍රික්කයේ ජනගහනය

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ජනගහනය

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මුළු ජනගහනය | **පවුල්** |
|---|---|---|
| මන්නාරම නගරය | 72,340 | 20,344 |
| නානාට්ටාන් | 21,770 | 6,964 |
| මුසලි | 29,419 | 8,631 |
| මාන්තෛ බටහිර | 26,241 | 7,693 |
| මඩු | 13,326 | 4,123 |
| **එකතුව** | **163,096** | **47,755** |

- ජනවර්ග මට්ටමෙන් ජනගහනය

| **ජන වර්ග** | සංඛ්‍යාව |
|---|---|
| දෙමළ | 93,162 |
| මුස්ලිම් | 69,002 |
| සිංහල | 932 |
| **එකතුව** | **163,096** |

## ලියාපදිංචි ඡන්ද දායකයින්

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ලියාපදිංචි ඡන්ද දායකයින් සංඛ්‍යාව |
|---|---|
| මන්නාරම නගරය | 39,106 |
| නානාට්ටාන් | 14,250 |
| මුසලි | 15,073 |
| මාන්තෛ බටහිර | 13,431 |
| මඩු | 6,982 |
| එකතුව | **88,842** |

## දිස්ත්‍රික්කයේ කාලගුණික තත්වය

මන්නාරම දිස්ත්‍රික්කය ඉතා උෂ්ණාධික ප්‍රදේශයකි. වර්ෂාව ඉතා අවම ප්‍රදේශයක් ලෙසද හඳුන්වයි. මන්නාරම දිස්ත්‍රික්කයේ උෂ්ණත්වය 28°C – 33°C ක් පමණ වන අතර වර්ෂාපතනය මිලිමීටර 74- මිලිමීටර 104 අතර පවතී.

## දිස්ත්‍රික්කයේ වැදගත් සංඛ්‍යා ලේඛන තොරතුරු

| | |
|---|---|
| ✓ දිස්ත්‍රික්කයේ නම | : මන්නාරම |
| ✓ පළාතේ නම | : උතුරු පළාත |
| ✓ මුළු බිම් ප්‍රමාණය | : 2,002 Sq.km |
| ✓ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව | : 05 |
| ✓ ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව | : 153 |
| ✓ ගම්මාන සංඛ්‍යාව | : 616 |
| ✓ ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව | : 75 |
| ✓ මහ නගර සභා සංඛ්‍යාව | : නැත |
| ✓ නගර සභා සංඛ්‍යාව | : 01 |
| ✓ ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | : 04 |
| ✓ නිවාඩු නිකේතන, රජයේ නිළ නිවාස | : 37 |
| ✓ පාසල් හා ගුරුවරුන් සංඛ්‍යාව | : 199 |
| ✓ පාසල් හා ගුරුවරුන් සංඛ්‍යාව | : පාසල් - 135, ගුරුවරුන් - 2,108 |
| ✓ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව | : 06 |
| ✓ පළාත් සභා සභිකයින් සංඛ්‍යාව | : 05 |
| ✓ පළාත් පාලන මන්ත්‍රීවරුන් සංඛ්‍යාව | : 93 |
| ✓ ජනගහනය | : 163,096 (2019ජන සංගණනය) |

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

මන්නාරම ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහාවූ තිරසාර සංවර්ධන ක්‍රියාවලියේ පුරෝගාමී මෙහෙයුම්කරු.

**මෙහෙවර**

රජයේ සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා දිස්ත්‍රික්කයේ හා ප්‍රාදේශිය මට්ටමේ පවතින ආයතනවල ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම, ඔවුන්ගේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සහ කාර්යක්ෂමව, ඵලදායී සේවා සැපයීම තහවුරු කරමින් අවම පිරිවැයෙන් අවශ්‍යතාවයන් ඉටුකරමින් ජනතාවගේ අවශ්‍යතා සැපයීම.

**අරමුණ**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණ වන්නේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් මඟින් විවිධ නීතිරීති වලට යටත්ව පවරා ඇති වැඩකටයුතු ඒකාබද්ධ කිරීම, සමාජ, ආර්ථික, සංවර්ධන ව්‍යාපෘති ඇති කිරීම. එය අධීක්ෂණය කිරීම හා නිරීක්ෂණය කිරීම සිදුකොට එම අවශ්‍යතාවයන් වෙනුවෙන් කටයුතු කර ඒවා තහවුරු කිරීමය.

## 1.3. ප්‍රධාන කාර්යයන්

- සේවකයින් සම්බන්ධව සියළු කටයුතු සිදුකිරීම. (පුද්ගලික ලිපිගොණු, නිවාඩු, වැටුප්, අතිකාල දීමනා, නිවාඩු දින දීමනා, සේවක ගමන් බලපත්‍ර, ණය සහන)

**පොදු ජනතාව සඳහා සේවය ලබාදීම සහ ඒවා පහසුවෙන් ලබාගැනීම සඳහා මාර්ග සැකසීම.**

- හැඳුනුම්පත් ලබාදිම, මෝටර් ප්‍රවාහන බද්ධ, ව්‍යාපාර අවසර පත්‍ර, උප්පැන්න මරණ සහ විවාහ සහතික,. රියදුරු බලපත්‍ර ලබාදීම.
- ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම.
- ඉඩම් ඔප්පු සහ බලපත්‍ර ලබාදීම විධිමත් කිරීම සහ ඉඩම් ගැටළු විසඳීම.
- වැඩිහිටි සහ ආබාධිත අය සඳහා මාසික සහනාධාරය.
- මහජනතාවගේ මානසික සුවතාවය නංවාලීම සඳහා කටයුතු කිරීම.
- රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා රැකියා පුහුණු සහ කාන්තා ගෘහ මූලික පවුල් සඳහා ස්වයං රැකියා පුහුණු වහා දිරිගැන්වීම.

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු කරා ලඟාවීම සඳහා කාර්යක්ෂම ලෙස ප්‍රතිපාදන ලබාදී ගිණුම් ක්‍රම අනුගමනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.**

- දිස්ත්‍රික්කයට වෙන් කරන ලද වාර්ෂික ප්‍රතිපාදන නිසි අනුමැතිය සමඟ ඵලදායී ලෙස භාවිතා කිරීම සහ ගණන් තැබීම.
- සේවකයන් සඳහා සියළු දීමනා ලබාදීම
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තිබෙන මුදල් නිසි අවසරය මත අදාල අවශ්‍යතාවයන් සඳහා භාවිතා කිරීම
- මාසික, වාර්ෂික වාර්තා දෙපාර්තමේන්තු වලට, අමාත්‍යාංශවලට සහ භාණ්ඩාගාරයට යැවීම
- දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබාගනු ලබන සේවා සඳහා දීමනා ගෙවීම
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ, වාර්ෂික ලැබීම සැලසුම් සකස් කිරීම

**දිස්ත්‍රික් කලා සංස්කෘතික කටයුතු සහ කාර්යක්ෂමතාවය සවිමත් කිරීම සඳහා කටයුතු කිරීම, ඒ සඳහා මාර්ග සකස් කිරීම.**

- සංස්කෘතික උත්සව පැවැත්වීම, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ වැඩසටහන්

**දිස්ත්‍රික්කයේ තිබෙන සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම සහ ඒ සඳහා සැලසුම් සකස් කිරීම.**

- දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය
- දිස්ත්‍රික් රැකියා පුහුණු මධ්‍යස්ථානය
- දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය

**මහජන ආරක්ෂාව සැලසීම සහ මහජනතාව සඳහා අත්‍යාවශ්‍ය සේවා ලබාදීම.**

- රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඒකාබද්ධව දිස්ත්‍රික්කයේ ඇතිවන ආපදා වලදී (ගංවතුර, සුළි සුළං, අධික වර්ෂාව, ඉඩෝරය) මහජනතාවගේ ආරක්ෂාව සඳහා පොලීසිය සහ යුධ හමුදා සහ නාවික හමුදා සහාය ලබාගැනීම.

**දිස්ත්‍රික්කයේ තිබෙන සියළු සංඛ්‍යා ලේඛන තොරතුරු එක් රැස්කිරීම සහ සංරක්ෂණය කිරීම**

- මෙය සංඛ්‍යා ලේඛන අංශය විසින් සිදුකරනුලබයි.

**ප්‍රාදේශිය ග්‍රාම සංවර්ධන කටයුතු සඳහා සැළසුම් සකස් කිරීම හා සංවිධානය කිරීම**

- මාර්ග සංවර්ධනය, වාරිමාර්ග, විදුලි පහසුකම්
- විමධ්‍යගත අයවැය මඟින් ලැබෙන ප්‍රතිපාදන වලින් දිස්ත්‍රික් සංවර්ධන කටයුතු සිදුකිරීම හා අධීක්ෂණය කිරීම
- දැනට රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම. (දිවි නැගුම)
- නිවාස සැලසුම
- යුද්ධයෙන් පීඩාවට පත්වූවන් සඳහා වන්දි ලබාදීම



දිස්ත්‍රික් ලේකම් කාර්යාල කාර්ය මණ්ඩලය

## 1.4. සංවිධාන සටහන


District Secretary / Government Agent
D.S.OfficeMannthai west
Director (Planning)
Addl.District Secretary/Addl. Government Agent
Chief Accountant
Chief Internal Auditor
District Election Office
District Registrar Office
Assistant Director
Asst. District Secretary
District Engineer
Accountant
Internal Auditor
District Statistical Branch
District Diveneguma Office
D.S.OfficeMannar Town
Administrative Officer
Asst. Land Commissioner Office
Unit Of Motor Traffic
Disaster Management Unit
D.S.OfficeMusali
Head of the Branch
Staff Assistant
Head of the Branch
Head of the Branch
Agriculture Unit
Coastal Conservation Unit
Measurement Unit
Development Officer
Development Officer
Development Officer
Development Officer
Development Officer
Social Service Unit
D.S.OfficeNanattan
District Land Use Planning Office
Management Assistant
Management Assistant
Management Assistant
Management Assistant
Management Assistant
District Sports Unit
Rural Development Unit
OES and Drivers
OES and Drivers
OES and Drivers
OES and Drivers
OES and Drivers
Child and Women Development Unit
D.S.OfficeMadhu
Manpower, Employment and Productivity Unit

## 1.5. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

- මන්නාරම නගරය
- නානාට්ටාන්
- මුසලි
- මාන්තෙයි බටහිර
- මඩු

## 1.6. අරමුදල්

**මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ශීර්ෂ අංකය– 265**

| වැය විෂයය | අයවැය ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන | මුළු ශුද්ධ ප්‍රතිපාදන |
|---|---|---|
| **පුනරාවර්තනවියදම්** | | |
| 1001 - වැටුප් හා වේතන | 123,300,000 | 121,300,000 |
| 1002 - අතිකාල හා නිවාඩු දින වැටුප් | 4,600,000 | 4,600,000 |
| 1003 - වෙනත් දීමනා | 33,100,000 | 43,100,000 |
| 1101 - දේශීය | 3,200,000 | 4,039,500 |
| 1201 - ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 5,150,000 | 4,980,000 |
| 1202 - ඉන්ධන | 6,250,000 | 4,891,000 |
| 1203 - ආහාර පාන හා නිල ඇඳුම් | 1,375,000 | 962,500 |
| 1205 - වෙනත් | 900,000 | 940,000 |
| 1301 - වාහන | 8,000,000 | 8,200,000 |
| 1302 - යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,700,000 | 1,880,800 |
| 1303 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 3,200,000 | 3,200,000 |
| 1401 - ප්‍රවාහන | 1,725,000 | 1,045,000 |
| 1402 - තැපැල් හා සන්නිවේදන | 3,300,000 | 2,923,000 |
| 1403 - විදුලිය හා ජලය | 6,000,000 | 6,249,200 |
| 1404 - බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 50,000 | 575,000 |
| 1409 - වෙනත් | 11,300,000 | 12,990,500 |
| 1506 - රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී | 850,000 | 573,500 |
| **එකතුව** | **214,000,000** | **222,450,000** |
| **මූලධන වියදම්** | | |
| 2001 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 8,000,000 | 8,000,000 |
| 2002 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 650,000 | 650,000 |
| 2003 - වාහන | 2,700,000 | 2,700,000 |
| 2102 - ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 5,350,000 | 5,350,000 |
| 2103 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,500,000 | 1,500,000 |
| 2104 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 55,500,000 | 55,500,000 |
| 2401 - කාර්ය මණ්ඩල පුහුණු | 1,300,000 | 1,300,000 |
| 2509 - වෙනත් | 0 | 1,350,000 |
| **එකතුව** | **75,000,000** | **76,350,000** |
| **මුළු පුනරාවර්තන හා මූලධන වියදම්වල එකතුව** | **289,000,000** | **298,800,000** |

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

- නැත

# 2. 02 වන පරිච්ඡේදය – ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

## 2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

### ජයග්‍රහණ

මන්නාරම පරිපාලන දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහකට බෙදා වෙන් කර ඇති අතර එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් ග්‍රාම නිලධාරී වසම් 153 ක් ලෙස නැවත බෙදා වෙන් කර ඇත. සමස්ත දිස්ත්‍රික් පරිපාලනයේ ප්‍රධානත්වය දරනු ලබන්නේ දිස්ත්‍රික් ලේකම්වරයා විසිනි.

කාර්යයන් හා තනතුරු අතර සම්බන්ධතාවය තීරණය කරන කළමනාකරණ ව්‍යුහයක්සංවිධානයට ඇති අතර නිශ්චිත කාර්යයන් ඉටු කිරීම සඳහා එහි කාර්යභාරය, වගකීම් හා බලය පැවරීම ද මෙම ව්‍යුහය තවදුරටත් කොටස් වශයෙන් බෙදා දක්වයි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල කළමණාකරණය යම් යම් ජයග්‍රහණ අත්කර ගැනීම සඳහා බෙහෙවින්ම අදාළ පරිපාලනයක් සිදු කිරීම සඳහා සහය වන මූලික පරිසරයක් නිර්මාණය කරමින් සිටී.

- ❖ දිස්ත්‍රික්කයේ නිවාස නොමැති පවුල් 1,210 සඳහා ස්ථිර නිවාස ලබාදී ඇත.
- ❖ දරිද්‍රතාව පිටුදැකීමේ අරමුණින් පවුල් 10,225 ක් සඳහා සමෘද්ධි සහනාධාර ප්‍රදානය කර ඇත.
- ❖ කෘෂිකාමික කටයුතු වලට දායකත්වයක් ලෙස ජලාශ 24 ක් ප්‍රතිසංස්කරණය කොට ඇත.
- ❖ උතුරු පලාත් මළල ක්‍රීඩා තරගාවලියේදී අප දිස්ත්‍රික්කය දෙවන ස්ථානය දිනා ගැනීමට සමත්ව ඇත.
- ❖ යටිතල පහසුකම් විශේෂයෙන්ම මාර්ග, සනීපාරක්ෂණ, විදුලිබල සහ ගෘහස්ත ජල සැපයුම් වැඩිදියුණු කර ඇත.
- ❖ සුළං බල, පිවිතුරු බලශක්ති, විදුලි බල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.
- ❖ නගරයේ බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මුළුමනින්ම පාහේ සම්පූර්ණ කර ඇත.
- ❖ අපගේ මානව සම්පත් අංශය මගින් රැකියා විරහිත තරුණ තරුණියන් 60 දෙනකු පුද්ගලික අංශයේ රැකියා වෙත යාමු කර ඇත.

### අභියෝග

මානව සම්පත් :- මහජනතාව වෙත විශිෂ්ඨ සේවයක් ලබාදීම සඳහා අවශ්‍ය වන මූලිකම අංගය මානව සම්පතයි. මෙහිදී අපගේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රමාණවත් තරම් මානව සම්පත් නොමැති අතර කළමනාකරණ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වාම මෙම තත්වය පවතී. තවද මන්නාරම නගරය, මඩු, මාන්තෙයි බටහිර සහ මුසලි යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS)1 පෙළ නිලධාරීන් නොමැති බැවින් එම තනතුරුශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) 111 පෙළ නිලධාරීන් විසින් ආවරණය කරනු ලබයි.

**මූල්‍යමය අභියෝග**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් රජ ය් මූල්‍ය ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති රැසක්ම ක්‍රියාවට නංවයි. මෙහිදී වාර්ෂිකව පහත දක්වා ඇති අභියෝගයන්ට මුහුණ දීමට සිදුව ඇත.

1. ප්‍රතිපාදන සහ අග්‍රිම නියමිත වේලාවට නොලැබීම.
2. අවශ්‍ය වේලාවට ප්‍රමාණවත් තරම් අග්‍රිම නිදහස් නොකිරීම.
3. සෑම ව්‍යාපෘතියකම ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් අනවශ්‍ය ලෙස ව්‍යාපෘති කාලයන් දීර්ඝ කරදීමට සිදුව ඇත. එම නිසා අප හට නියමිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකිවී ඇත.
4. බහුතර ව්‍යාපෘති ප්‍රමාණයක ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවන්ට ලැබිය යුතු ගෙවීම් ප්‍රමාද වීම.
5. ව්‍යාපෘති රැසකම අනුමැතීන් වසරේ අවසන් භාගයේදී ලැබෙන අතර එහිදී කාලගුණ තත්වයන් (වර්ෂාව) හේතුවෙන් නියමිත කාල රාමුව තුල එම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට නොහැකිව ඇත.

**භෞතිකමය අභියෝග**

කාර්යාල ගොඩනැගිලි පහසුකම් ප්‍රමාණවත් නොවීම, විශේෂයෙන්ම නානාට්ටාන් ප්‍රදේශීය ලේකම් කාර්යාලය මේ දක්වාම පැරණි කුඩා ගොඩනැගිල්ලක ක්‍රියාත්මකව පවතී. උපාධිධාරී රැකියා පුහුණුව සඳහා නවක නිලධාරීන් රැසක්ම මෙම කාර්යාලයට අනුයුක්ත කර තිබුණද ඔවුන්ට අපේක්ෂිත පුහුණුවීම් ලබාදීමට තරම් ඉඩපහසුකම් නොමැත.

පුහුණුව සඳහා අනුයුක්ත කර ඇති උපාධිධාරීන් සඳහා ප්‍රමාණවත් තරම් කාර්යාල උපකරණ නොමැතිවීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුල අසීරුතා රැසකට මුහුණ දීමට සිදුව ඇත.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නිරතුරුවම විදුලි බල විසන්ධිවීම් මධ්‍යයේම ක්‍රියාත්මකව පවතී. අප සතුව විදුලි උත්පාදන යන්ත්‍රයක් (Generator) නොමැති වීම නිසා මෙවන් අවස්තාවකදී තාවකාලික විදුලි සැපයුමක් ලබාගැනීමටද නොහැකිව ඇත.

**ඉලක්ක**

යහපාලන ක්‍රියාවලියක් සකස් කිරීම තුළින් තිරසර සංවර්ධනයක් කරා දිස්ත්‍රික්කය මෙහෙයවීමට ගතික කාර්ය සාධන කණ්ඩායම් නිර්මාණය කිරීම හා ඵලදායී හා කාර්යක්ෂම පරිපාලනයකින් හා ප්‍රශස්ත සම්පත් කළමනාකරණයකින් යුතුව ජන ජීවිතය සවිබල ගැන්වීම සිදුකළ යුත්තේ රාජ්‍ය හා පෞද්ගලික අංශය, දේශපාලනඥයින් මහජනතාව වැනි සියළුම කොටස්කරුවන්ගේ පූර්ණ සහයෝගය ඇතිවය. යහපාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් මේ ආකාරයේ සහයෝගීතාවය හා සහභාගීත්වය සංවිධානය කළ යුතුය. එවිට, දිස්ත්‍රික් මට්ටමින් පමණක් නොව ජාතික මට්ටමින් ද ඉහත අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අප හට හැකිවනු ඇත.

..........................

**සී.ඒ. මෝහන්රාස්**
දිස්ත්‍රික්ලේකම්/ දිසාපති
මන්නාරම පරිපාලන දිස්ත්‍රික්කය

## 3. 03 වන පරිච්ඡේදය – සමස්ත මූල්‍ය කාර්ය සාධනය - 2019 වර්ෂය

### 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කායර්සාධන ප්‍රකාශය

රු.

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 | තත්‍ය 2018 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ACA-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 2,701,001,500 | 2,104,159,880 | ACA-3 |
| - | තැන්පතු | | 340,251,065 | 169,275,583 | ACA-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 10,932,117 | 11,774,314 | ACA-5/5(a)/5(b) |
| - | වෙනත් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **3,052,184,682** | **2,285,209,777** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **3,052,184,682** | **2,285,209,777** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 169,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 164,809,285 | 147,518,493 | ACA-2(ii) |
| 52,876,500 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 49,068,923 | 47,568,602 | |
| 573,500 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 437,985 | 360,317 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **222,450,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **214,316,193** | **195,447,412** | |
| | **මූලධන වියදම්** | | | | |
| 11,350,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 7,395,301 | 10,972,735 | ACA-2(ii) |
| 62,350,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 22,153,195 | 37,675,623 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 1,300,000 | හැකියා වර්ධනය | 14 | 923,035 | 1,099,376 | |
| 1,350,000 | වෙනත් මූලධන වියදම් | 15 | 1,349,995 | - | |
| **76,350,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **31,821,526** | **49,747,734** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **275,831,441** | **192,037,293** | |
| | **තැන්පතු ගෙවීම්** | | 263,039,697 | 174,317,404 | ACA-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 12,791,744 | 17,719,889 | ACA-5/5(a)/5(b) |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | **521,969,160** | **437,232,439** | |
| - | ..........දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ) | | **2,530,215,522** | **1,847,977,338** | |

1

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

RTMENT
28 FEB 2020
MANNAR ........
Signature

ඒසීඒ-8

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 559,577,839 | 496,979,546 |
| මූල්‍ය වත්කම් | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 53,133,769 | 51,692,164 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | 612,711,608 | 548,671,710 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| ශුද්ධ වත්කම් | | (154,356,356) | (77,576,461) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 559,577,839 | 496,979,546 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | |
| ජංගම වගකීම් | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 206,485,368 | 129,268,625 |
| ඉදිම ශේෂය | ඒසීඒ-3 | 1,004,757 | - |
| මුළු වගකීම් | | 612,711,608 | 548,671,710 |

පිටු අංක 04 සිට 47 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක48 සිට 58 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධමර්වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, සහ අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2020/02/28 | දිනය : 28/02/2020 | දිනය : 28/02/2020 |

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
"සිල් මැඳුර"
ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

C. A. Mohan Ras,
District Secretary
Mannar.

M.Selvaratnam.
Chief Accountant,
District Secretariat,
Mannar.

2

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-ඕ

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සතය 2019 රු. | 2018 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 79,226,561 | 2,247,604,017 |
| අග්‍රිම ලැබීම් | 2,701,001,500 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | **2,780,228,061** | **2,247,604,017** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 213,418,523 | 2,197,495,966 |
| සහනාධාර සහ මාරුකිරීම් | 437,985 | 360,317 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 2,605,235,656 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 1,004,757 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | **2,820,096,921** | **2,197,856,283** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | **(39,868,860)** | **49,747,734** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| නිම්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 15,023,251 | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | 15,023,251 | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | | |
| අත්තිකාරම් ගෙවීම් | 31,821,526 | 49,747,734 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 20,544,233 | - |
| | 52,365,759 | 49,747,734 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | (37,342,508) | (49,747,734) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ) | (77,211,368) | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | | |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | 340,251,065 | - |
| | 340,251,065 | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | 263,039,697 | - |
| | 263,039,697 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | 77,211,368 | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) -(ඒ) | | |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

3

## 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

| | |
|---|---|
| **වාර්තා කිරීමේ පදනම** | |
| | |
| 1) | වාර්තාකරණ කාල පරිච්ඡේදය |
| | |
| | 2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වාවූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ. |
| | |
| 2) | මිනුම්කරණ පදනම |
| | |
| | මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරිම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. |
| | |
| | මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත. |
| | |
| 3) | ආදායම් හඳුනා ගැනීම |
| | |
| | හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ. |
| | |
| 4) | දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම |
| | |
| | වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. |
| | |
| | දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී. |
| | |
| 5) | දේපළ, පිරියත හා උපකරණ සංචිතය |
| | |
| | මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ. |
| | |
| 6) | මුදල් හා මුදල් සමාන දෑ |
| | |
| | 2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විතවේ. |
| | |

## 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 1003.07.02 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාළ ලියාපදිංචි කිරීමේ ගාස්තු | - | - | 3,956,450 | - |
| 1003.07.03 | පෞද්ගලික දැව ප්‍රවාහනය | - | - | 79,895 | - |
| 1003.07.05 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ බලපත්‍ර ගාස්තු | 1,200 | 1,200 | 1,200 | 100.00 |
| 1003.07.09 | කාබන් බද්ද | - | | 6,499,877 | - |
| 1003.07.99 | අනෙකුත් | 121,000 | 65,000 | 81,483 | 125.36 |
| 2002.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | 1,157,780 | 1,007,230 | 2,598,674 | 258.00 |
| 2002.02.99 | වෙනත් | 1,965,000 | 1,750,000 | 2,785,539 | 159.17 |
| 2003.02.13 | විභාග හා අනෙකුත්ගාස්තු | - | - | 169,300 | - |
| 2003.02.14 | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු සහ අනෙකුත් | - | - | 22,460,655 | - |
| 2003.02.03 | 1968 අංක32 දරණ පු.ලි.ප. කිරීමේ පනත යටතේ ගාස්තු | - | - | 2,229,950 | - |
| 2003.02.06 | වන සත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ ආඥා පනත යටතේ ගාස්තු | - | - | 219,700 | - |
| 2003.02.99 | විවිධ | 39,915 | 39,915 | 39,915 | 100.00 |
| 2003.07.00 | වී ආදායම | - | - | 15,672,960 | - |
| 2003.99.00 | අනෙකුත් ලැබීම් | 3,609,931 | 3,550,000 | 10,789,072 | 303.92 |
| 2004.01.00 | මධ්‍යම රජය | - | - | 11,373,406 | - |
| 2006.02.02 | ප්‍රාග්ධන වත්කම් විකිණීම | - | - | 268,485 | - |
| එකතුව | | **6,894,826** | **6,413,345** | **79,226,561** | |

## 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| වැය විෂයය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | අයවැය ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| **පුද්ගල පඩිනඩි** | | | | |
| 1001 - වැටුප් හා වේතන | 123,300,000 | 121,300,000 | 118,381,806 | 97.59 |
| 1002 - අතිකාල හා නිවාඩු දින වැටුප් | 4,600,000 | 4,600,000 | 4,106,140 | 89.26 |
| 1003 - වෙනත් දීමනා | 33,100,000 | 43,100,000 | 42,321,339 | 98.19 |
| **ගමන් වියදම්** | | | | |
| 1101 - දේශීය | 3,200,000 | 4,039,500 | 3,751,664 | 92.87 |
| **සැපයීම්** | | | | |
| 1201 - ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 5,150,000 | 4,980,000 | 4,846,849 | 97.33 |
| 1202 - ඉන්ධන | 6,250,000 | 4,891,000 | 4,412,723 | 90.22 |
| 1203 - ආහාර පාන හා නිල ඇඳුම් | 1,375,000 | 962,500 | 654,274 | 67.98 |
| 1205 - වෙනත් | 900,000 | 940,000 | 714,413 | 76.00 |
| **නඩත්තු වියදම්** | | | | |
| 1301 - වාහන | 8,000,000 | 8,200,000 | 7,347,995 | 89.61 |
| 1302 - යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,700,000 | 1,880,800 | 1,787,019 | 95.01 |
| 1303 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 3,200,000 | 3,200,000 | 2,792,132 | 87.25 |
| **සේවා** | | | | |
| 1401 - ප්‍රවාහන | 1,725,000 | 1,045,000 | 1,026,105 | 98.19 |
| 1402 - තැපැල් හා සන්නිවේදන | 3,300,000 | 2,923,000 | 2,762,245 | 94.50 |
| 1403 - විදුලිය හා ජලය | 6,000,000 | 6,249,200 | 5,831,268 | 93.31 |
| 1404 - බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 50,000 | 575,000 | 573,483 | 99.74 |
| 1409 - වෙනත් | 11,300,000 | 12,990,500 | 12,568,753 | 96.75 |
| **මාරු කිරීම්** | | | | |
| 1506 - රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 850,000 | 573,500 | 437,985 | 76.37 |
| | | | | |
| **එකතුව** | **214,000,000** | **222,450,000** | **214,316,193** | |
| **මූලධන වියදම්** | | | | |
| **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | | |
| 2001 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 8,000,000 | 8,000,000 | 6,160,197 | 77.00 |
| 2002 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 650,000 | 650,000 | 305,054 | 46.93 |
| 2003 - වාහන | 2,700,000 | 2,700,000 | 930,050 | 34.45 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | |
| 2102 - ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 5,350,000 | 5,350,000 | 3,128,957 | 58.49 |
| 2103 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,500,000 | 1,500,000 | 828,830 | 55.26 |
| 2104 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 55,500,000 | 55,500,000 | 18,195,408 | 32.78 |
| **හැකියා වර්ධනය** | | | | |
| 2401 - කාර්ය මණ්ඩල පුහුණු | 1,300,000 | 1,300,000 | 923,035 | 71.00 |
| **වෙනත් මූලධන වියදම්** | | | | |
| 2509 - වෙනත් | 0 | 1,350,000 | 1,349,995 | 100.00 |
| | | | | |
| **එකතුව** | **75,000,000** | **76,350,000** | **31,821,526** | |
| | | | | |
| **පුනරාවර්තන හා මූලධන වියදම්වල මුළු එකතුව** | **289,000,000** | **298,800,000** | **246,137,719** | |

## 3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ශීර්ෂ අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන % ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | 001 | ජනාධිපති ලේකම් කාර්යාලය | ග්‍රාම ශක්ති ව්‍යාපෘතිය, ස්මාර්ට් ශ්‍රී ලංකා | 45,269,090 | 45,269,090 | 22,214,339 | 49.07 |
| 2 | 051 | ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය | පාසල් පරිගණක විද්‍යාගාර අලුත්වැඩියාව සහ අනෙකුත් පුනරාවර්තන | 5,015,150 | 5,015,150 | 4,530,873 | 90.34 |
| 3 | 052 | විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය | විද්‍යුත් පුහුණු වැඩසටහන සහ අනෙකුත් පුනරාවර්තන | 1,659,866 | 1,659,866 | 1,402,521 | 84.50 |
| 4 | 101 | බුද්ධශාසන සහ වයඹ සංවර්ධනඅමාත්‍යාංශය | මන්නාරම දිස්ත්‍රික් මහ විහාරයේ ඉදිකිරීම් සහ අලුත්වැඩියා කටයුතු | 1,744,500 | 1,744,500 | 1,122,412 | 64.34 |
| 5 | 104 | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, උතුරු පලාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය | DCB, නැවත පදිංචි කිරීමේ සහ පුනරුත්ථාපන සංවර්ධන කටයුතු | 2,278,828,331 | 2,278,828,331 | 1,747,303,088 | 76.68 |
| 6 | 110 | අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | සමථ මූල මණ්ඩල සාමාජිකයින්ගේ දීමනා සහ අනෙකුත් පුනරාවර්තන | 3,181,800 | 3,181,800 | 2,623,170 | 82.44 |
| 7 | 118 | මහවැලි, කෘෂි කර්මාන්ත, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය | දියවර පියස නිවාස අලුත්වැඩියා ව්‍යාපෘතිය සහ අනෙකුත් පුනරාවර්තන | 45,119,054 | 45,119,054 | 41,998,378 | 93.08 |
| 8 | 120 | ළමා හා කාන්තා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ පැකේජය සහ අනෙකුත් පුනරාවර්තන | 36,233,560 | 36,233,560 | 36,082,070 | 99.58 |
| 9 | 122 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | බිම් සවිය වැඩසටහන | 239,850 | 239,850 | 97,000 | 40.44 |
| 10 | 124 | ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | ආබාධිත අයවලුන්, වයස අවුරුදු 70 ට වැඩි අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා ගෙවීම්සහ අනෙකුත් පුනරාවර්තන | 75,794,557 | 75,794,557 | 73,342,276 | 96.76 |
| 11 | 130 | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය | පානීය ජල පහසුකම් සහ අනෙකුත් පුනරාවර්තන | 13,731,856 | 13,731,856 | 7,704,122 | 56.10 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **12** | **149** | කර්මාන්ත සහ වාණිජ, දීර්ග කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය | කුඩා මධ්‍ය පරිමාණ ඇගලුම් කර්මාන්ත සහ වෙනත් ප්‍රාග්ධන කටයුතු | 1,124,855,405 | 1,124,855,405 | 440,911,527 | 39.20 |
| **13** | **155** | රාජ්‍ය පරිපාලන, අභ්‍යන්තර කටයුතු හා පලාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශය | වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන | 79,450,353 | 79,450,353 | 78,357,190 | 98.62 |
| **14** | **157** | ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ අභිවෘද්ධි සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සහ අනෙකුත් පුනරාවර්තන | 103,990,079 | 103,990,079 | 33,289,920 | 32.01 |
| **15** | **159** | සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | තේක්කම්හි කුන්චුකුලම් එල්ලෙන පාලම අලුත්වැඩියා කිරීම | 2,366,793 | 2,366,793 | 698,927 | 29.53 |
| **16** | **193** | ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | ආබාධිත අයවලුන්, වයස අවුරුදු 70 ට වැඩි අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සදහා ගෙවීම්සහ අනෙකුත් පුනරාවර්තන (පැරණි ශීර්ෂය) | 26,153,484 | 26,153,484 | 26,135,524 | 99.93 |
| **17** | **194** | නිපුනතා සංවර්ධන, රැකීරක්ෂා සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය | වෘත්තීය පුහුණු සහ අනෙකුත් පුනරාවර්තන | 3,555,204 | 3,555,204 | 3,037,744 | 85.44 |
| **18** | **195** | සංවර්ධනඋපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළදාම් අමාත්‍යාංශය | වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන | 163,320 | 163,320 | 163,320 | 100.00 |
| **19** | **202** | මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | විඩත්තල්තීවු මොහිදින් ජුම්මා පල්ලියේ සංවර්ධන කටයුතු | 500,000 | 500,000 | 489,690 | 97.94 |
| **20** | **203** | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | මධුසිද්ධස්ථානය ෙ අභ්‍යන්තර මාර්ගය වැඩිදියුණු කිරීමේ කටයුතු | 199,500,000 | 199,500,000 | 37,882,631 | 18.99 |
| **21** | **206** | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | දොළොස්මහේ පහන,ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ අනෙකුත් පුනරාවර්තන | 965,500 | 965,500 | 912,722 | 94.53 |
| **22** | **216** | සමාජ සේවා දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ අනෙකුත් පුනරාවර්තන | 2,017,653 | 2,017,653 | 1,984,488 | 98.36 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **23** | **217** | පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ අනෙකුත් පුනරාවර්තන | 3,146,330 | 3,146,330 | 3,124,017 | 99.29 |
| **24** | **219** | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | ක්‍රීඩා ශක්ති පෝෂණ ගෙවීම් | 3,937,847 | 3,937,847 | 3,878,866 | 98.50 |
| **25** | **227** | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන | 2,434,631 | 2,434,631 | 2,396,846 | 98.45 |
| **26** | **243** | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | ගබඩා කාමර, මෙහෙයුම් වියදම් | 24,461,163 | 24,461,163 | 8,536,110 | 34.90 |
| **27** | **252** | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | නිවාස සංගණනය සහ අනෙකුත් පුනරාවර්තන | 1,344,555 | 1,344,555 | 1,220,875 | 90.80 |
| **28** | **253** | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | සිවිල් විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | 21,220,213 | 21,220,213 | 20,969,263 | 98.82 |
| **29** | **254** | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | රෙජිස්ට්‍රාර් දීමනා | 588,120 | 588,120 | 117,850 | 20.04 |
| **30** | **284** | වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ආරක්ෂිත වන සතුන්ගෙන් වන හානි සදහා වන්දි ගෙවීම | 1,405,000 | 1,405,000 | 1,405,000 | 100.00 |
| **31** | **307** | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | මෝටර් රථ ප්‍රවාහන පුනරාවර්තනවියදම් | 713,500 | 713,500 | 628,489 | 88.09 |
| **32** | **326** | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | පුනරාවර්තනවියදම් | 3,000 | 3,000 | 3,000 | 100.00 |
| **33** | **327** | ඉඩම් පරිහරණ සහ සැලසුම් දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් යාවත්කාලීන කිරීම | 283,500 | 283,500 | 283,037 | 99.84 |
| **34** | **328** | මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන සහ අනෙකුත් පුනරාවර්තන | 415,675 | 415,675 | 388,371 | 93.43 |
| | | **එකතුව** | | **4,110,288,939** | **4,110,288,939** | **2,605,235,656** | |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| **වත්කම් කේතය** | **කේත විස්තරය** | **31-12-2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය** | **31-12-2019 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය** | **ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත** | **ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම** |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 334,239,360 | 334,239,360 | - | - |
| **9152** | යන්ත්‍රෝපකරණ | 171,942,364 | 171,942,364 | - | - |
| **9153** | ඉඩම් | 1,750,000 | 1,750,000 | - | - |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | 0 | 0 | - | - |
| **9155** | ජීව විද්‍යාත්මක වත්කම් | 0 | 0 | - | - |
| **9160** | කරිගෙන යන වැඩ | 51,646,115 | 51,646,115 | - | - |
| **9180** | බදු දෙන ලද වත්කම් | 0 | 0 | - | - |
| එකතුව | | **559,577,839** | **559,577,839** | - | - |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

**සිංහල පරිවර්තනය**

# ජාතික විගණන කාර්යාලය

මගේ අංකය - NNP/MN/A/DSM/02/19 ඔබ අංකය - දිනය - 2020 මැයි 29

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මන්නාරම

**මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණනයේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිබිඹු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 <u>මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම</u>

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් ලබාදෙන ලද උපදෙස් ක්‍රියාවට නංවා ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

### 1.6.1 මූල්‍ය තත්ව ප්‍රකාශනය

#### 1.6.1.1 තැන්පතු ගිණුම් ශේෂ

(අ) මූල්‍ය රෙගුලාසි 571 ප්‍රකාරව ගිණුම් 98 ක තැන්පතු එකතුව රු 4,908,054 ක් වන වසර දෙකකට වඩා පැරණි තැන්පතු සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොමැත.

(ආ) මුසලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි වසර දෙකකට වඩා පැරණි තැන්පතු වටිනාකම රු. 100,000 ක් වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සකස් කර භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති කාලීන විශ්ලේශන වාර්තාව අනුව මුසලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි අංක 600-00-16-0-16 තැන්පතු ශීර්ෂය යටතේ ලෙස රු. 122,616 ක් හෙළිදරව් කර ඇති අතර රු. 22,616 ක වටිනාකමෙහි විෂමතාවයක් නිරීක්ෂණය වේ.

### 1.6.2 ලේඛන සහ පොත්පත් පවත්වාගෙන නොයෑම

සමාලෝචිත වර්ෂ ය්දී සිදුකරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂාව අතරතුරදී අනාවරණය වූයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 452 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන විමසුම් ලේඛනය හරියාකාරව පවත්වාගෙන ගොස් නොමැති බවය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූලධන වැය වෙන්කිරීම් 07 ක මුළු එකතුව රු. 75,000,000 ක් ලෙස නිරීක්ෂණයවූ අතර ඒ අතරින් රු. 44,528,474 ක වටිනාකමක් ඉතිරිව ඇත. එය මුළු වෙන්කිරීම් වලින් සියයට 58 ක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) වැය කේතයන් සඳහා ප්‍රතිපාදන ලෙස වෙන් කරන ලද රු. 13,500,000 ක මුදලකින් සියයට 23 ක් හෙවත් රු. 3,105,000 ක මුදලක් වෙන්කරන ලද අපේක්ෂිත අවශ්‍යතාවයන් නොවන වනත් කේතයන් 04 කට මාරු කර ඇත. මේ තුලින් අයවැය සකස් කිරීමේ අකාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරයි.

(ඇ) වැය කේතයන් 04 ක් යටතේ ඇස්තමේන්තු කරන ලද රු. 38,050,000 ක මුදලකින් සියයට 08 කට අධික ප්‍රමාණයක් හෙවත් රු. 3,095,300 ක් එම තේකයක් සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙනත් වැය කේතයන් 05 කට වෙන් කර තිබූ ප්‍රතිපාදන වීරමොං ක්‍රියාපටිපාටිය ඔස්සේ ඒ සඳහා මාරු කර ඇත.

## 2.2 සීමාවන් ඉක්මවීම

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අයවැය ප්‍රතිපාදනයන්ට අනුව, ශීර්ෂ අංක 265 දරණ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අවම ලැබීම් මට්ටම රු. 11,000,000 ක් වුවද වර්ෂය තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබාගෙන ඇති අයකිරීම් එකතුව රු. 10,932,117 කි. ඒ අනුව වර්ෂය සඳහා රු. 67,883 කින් අවම ලැබීම් මට්ටම සාධනය කිරීමට නොහැකිවී ඇත.

## 2.3 අවිධිමත් ගනුදෙනු

රාජ්‍ය පරිපාලන, අභ්‍යන්තර කටයුතු හා පලාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය මත මන්නාරම සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා 2019 ඔක්තෝබර් මස 20 වන දින සිට නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස ස්ථාන මාරු කර ඇත. එනමුත් ඔහු නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රාජකාරි භාර නොගෙන තිබියදී 2019 නොවැම්බර් සහ දෙසැම්බර් යන මාස දෙක සඳහා නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වැටුප් ලෙස රු. 127,928 ක් ඔහුට ගෙවා ඇත. මේ බව නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2020 ජනවාරි 23 දිනැති වව්චර් අංක P200121/27/01 මගින් සහතික කර ඇත.

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම සහ පියවීම

(අ) නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රජයේ නිලධාරීන්ගේ ණය ලේඛනය (CC-10) අනුව ආපදා ණය වටිනාකම රු. 215,000 ක් ලෙසද එම කාර්යාලයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ රු. 245,000 ක් ලෙසද සඳහන්ව ඇත. ඒ අනුව රු. 30,000 ක් විෂමතාවයක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 18 දෙනකු වෙත ගෙවා ඇති උත්සව අත්තිකාරම් 18 කට අදාලව නිලධාරීන්ගේ ණය ලේඛන ය් අවසන් ශේෂයන් ඉදිරියට ගෙන ගොස් නැත.

(ඇ) සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු මත දෙවර්ෂයක (2017 ඔක්තෝබර් - 2019 ඔක්තෝබර්) විදෙස් අධ්‍යාපනය සඳහා නිදහස් කර ඇති මන්නාරම සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා රාජ්‍ය පරිපාලන, අභ්‍යන්තර කටයුතු හා පලාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය මත 2019 ඔක්තෝබර් මස 20 වන දින සිට නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස ස්ථාන මාරු කර ඇත. එනමුත් ඔහු නානාට්ටාන් ප්‍රාදේශීය

ලේකම් කාර්යාලයේ රාජකාරි භාර නොගෙන තිබියදී 2019 නොවැම්බර් සහ දෙසැම්බර් යන මාස දෙක සඳහා නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වැටුප් ගෙවා ඇත. තවද ඔහුගේ හිග ණය ශේෂය වන රු. 165,000 ක මුදල ලේඛනවල ඇතුලත් කර නොමැත.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී විවිධ හේතු මත නිලධාරීන් පස්දෙනකුගෙන් අයවිය යුතු රජයේ නිලධාරීන්ගේ ණය වටිනාකම වන රු. 459,531 ක් අය කර ගැනීම සඳහා සුදුසු පියවර ගෙන නොමැත.

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

මාන්තෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් 2015 වර්ෂයේ සිට අද දක්වා නිකුත් කර ඇති මුළු වටිනාකම රු. 1,371,155 ක් වන චක්පත් 49 ක් හඳුනා නොගත් ගෙවීම් ලෙස හඳුනාගෙන ඇති අතර ඒවායේ නිවරදාභාවය හඳුනාගෙන අවශ්‍ය කටයුතු කිරීම සඳහා පියවර ගෙන නොමැත.

## 3. මෙහෙයුම් සමාලෝචනය සහ කාර්ය සාධනය

ඉදිරිපත් කර ඇති ගිණුම් ප්‍රකාශනවල සඳහන් කර ඇති ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් වලට අදාලව මෙහෙයුම් සමාලෝචනය, තිරසර සංවර්ධනය, යහපාලනය සහ මානව සම්පත් සංවර්ධනය ඉහත 1.1 ඡේදයේ සඳහන් කර ඇති 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබනු ඇත.

අත්සන් කළේ - ඒ.ජේ.එල්. විමලරත්න
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

# 4. 04 වන පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තථ්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | **100%-90%** | **75%-89%** | **50%-74%** |
| ඉඩම් බලපත්‍ර | - | - | 70% |
| උප්පැන්න සහතික, මරණ සහතික, විවාහ සහතික | - | 80% | - |
| වාහන ආදායම් බලපත්‍ර | - | 84% | |
| ජාතික හැඳුනුම්පත් | - | - | 62% |
| ව්‍යාපාර ලියාපදිංචිය | - | 80% | - |

## 5. 05 වන පරිච්ඡේදය – තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1. හදුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න




### සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම

සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම යනු මානව වර්ගයා විසින් මුහුණ දෙනු ලබන එක් විශාලතම අභියෝගයක් ලෙස ඉතිරිව පවතී. වර්ෂ 1990 සිට 2015 දක්වා කාලය තුලදී ලෝකයේ වෙසෙන අන්ත දිළිඳු ජනගහනය සංඛ්‍යාත්මකව හරි අඩකට වඩා පහළ ගියද තවමත් විශාල ජනකායක් ස්වකීය මූලික අවශ්‍යතා සපුරාගත නොහැකිව දුෂ්කරතාවයට පත්ව සිටිති. වර්ෂ 2030 දී සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීමේ අරමුණ සපුරා ගැනීම සඳහා තිරසර සංවර්ධන අරමුණු වෙත විශාල වගකීමක් පැවරී ඇත. මෙහිදී වඩාත් බලපෑමට ලක්විය හැකි පාර්ශව, මූලික පහසුකම් හා සේවාවන් වර්ධනය කිරීම සහ ගැටුම් වලින් හා කාලගුණ තත්ව හේතුවෙන් ඇතිවන විපත් වලින් බලපෑමට ලක්වූ ප්‍රජාව වෙත ආධාර කිරීම කිරීම ඉලක්ක කර ඇත.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
|  | දිළිදුබව අඩු කිරීම | ජීවන තත්වය නගා සිටුවීම | 2019 වර්ෂයේ මන්නාරම දිස්ත්‍රික්කය සඳහාජනාධිපති ලේකම් කාර්යාලය මගින් ප්‍රතිපාදන සපයා අනුමත කරන ලද ව්‍යාපෘති යටතේ ණය මුදල් නිකුත් කිරීම සහ මාර්ග හා ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සිදුකර ඇත. | - | - | සැප්තැම්බර් – දෙසැම්බර් 2019 |
| | | ජීවන තත්වයන් වැඩිදියුණු කිරීම සහ මූලික අවශ්‍යතා සපුරාලීම. | දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යංශය මගින් පවුල් 10 ක් සඳහා ජීවනෝපාය උපකරණ ලබාදීම | - | - | 10 |
| | | දිළිදු සහ අනතුරට ලක් වියහැකි අය ප්‍රමාණවත් තරම් ආවරණය වන පරිදි වර්ෂ 2030 වන විට පහළ මට්ටම ඇතුළු සියල්ලන්ම සඳහාම ජාතික මට්ටමින් සුදුසු වන සමාජ ආරක්ෂණ පද්ධතීන් සහ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම. | දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යංශය මගින් 20 දෙනකු සඳහා රියදුරු බලපත්‍ර සහ ජීවනෝපාය මාර්ග සඳහා ආධාර ලබාදීම | 2 | 5 | 13 |




## නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
|  | යහපත් සෞඛ්‍ය හා සුභ සාධනය | ගුණාත්මක අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය සහ සුරක්ෂණය සඳහා ප්‍රවේශය | මුදල් අමාත්‍යාංශය මඟින් සායන මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම කිරීම | - | - | 1 |




## පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම

සැමට පරිපූර්ණ ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම මඟින් අධ්‍යාපනය යනු තිරසර සංවර්ධනය සඳහා වන වඩාත් බලවත් සහ ප්‍රත්‍යක්ෂ සාධකයක් යන විශ්වාසය නැවත තහවුරුවේ. මෙම ඉලක්කය මඟින් වර්ෂ 2030 වන විට සියළුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් සඳහා ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය නොමිලේ ලබාදීම සහතික කෙරේ.

එමෙන්ම වෘත්තීය පුහුණුවීම් සඳහා දැරිය හැකි මුදලකට සමාන ප්‍රවේශයක් ලබාදී ස්ත්‍රී පුරුෂ සහ දුප්පත් පොහොසත් විෂමතා දුරු කර ගුණාත්මක උසස් අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය ලබාදීම එහිදී ඉලක්ක කෙරේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| | ගුණාත්මක අධ්‍යාපනය | අධ්‍යාපනික පහසුකම් ගොඩනැගීම සහවැඩිදියුණු කිරීම, පාසල් සිසුන් 35 දෙනකු සඳහා සුදුසු අධ්‍යාපනික පරිසරයක් ලබාදීමට පහසුකම් සැලසීම | ජාතික සමගිය හා සංහිඳියා කාර්යංශය මගින් පාසල් සඳහා කැසිකිලි ඉදිකිරීම සහ පාසල්වල මායිම් වැටවල් සකස් කිරීම. | - | - | 02 |
| | | පාසල් සිසුන්ට සුදුසු පරිදි අධ්‍යාපනික පරිසරයක් ලබාදීම සඳහා අධ්‍යාපනික පහසුකම් ගොඩනැගීම සහවැඩිදියුණු කිරීම | ජාතික ඒකාබද්ධතා අමාත්‍යංශය මගින් පාසල් 06 ක් අළුත්වැඩියා කිරීම කිරීම | 01 | - | 05 |
| | | සෑම සිසුවකු සඳහාම දැරිය හැකි මුදලකට ගුණාත්මක අධ්‍යාපනික යටිතල පහසුකම් සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම. | නැවත පදිංචි කිරීමේ අමාත්‍යංශයමගින් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම, පන්ති කාමර අළුත්වැඩියා කිරීම කිරීම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | - | - | 10 |
| | | ළමා, ආබාධිත, ස්ත්‍රී පුරුෂ සංවේදී සහ ආරක්ෂාකාරී, සාමකාමී, පරිපූර්ණ සහ ඵලදායී අධ්‍යාපනික පරිසරයක් සෑමට ලබාදීම සඳහා අධ්‍යාපනික පහසුකම් ගොඩනැගීම සහවැඩිදියුණු කිරීම | දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යංශය මගින් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත්වැඩියා කිරීම, ගෘහ භාණ්ඩ සහ ක්‍රීඩා උපකරණ ලබාදීම - ව්‍යාපෘති 119 යි | 7 | 10 | 102 |
| | | සෑම සිසුවකු සඳහාම දැරිය හැකි මුදලකට ගුණාත්මක අධ්‍යාපනික යටිතල පහසුකම් සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම. | මුදල් අමාත්‍යංශය - RIDP මගින් පාසල් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සහ මායිම් තාප්ප ඉදිකිරීම | - | - | 19 |

## සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම

මේ වන විට වැඩිවැඩියෙන් රටවල්ජල ආතතිය අත්විදිමින් සිටින අතර ඉහළ යන නියඟය සහකාන්තාරකරණය හේතුවෙන් මෙම ප්‍රවණතාවය තවත් උග්‍රවී ඇත. වර්ෂ 2030 වන විට ආරක්ෂාකාරී සහ දැරිය හැකි මිලකට සැමට පානීය ජලය ලබාදීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සහ සෞඛ්‍යාරක්ෂණ ක්‍රම ප්‍රවර්ධනය සඳහා ආයෝජනය කිරීම අවශ්‍යවේ. ජල ආශ්‍රිත පාරිසරික පද්ධති ආරක්ෂා කිරීම සහ ප්‍රතිශ්ඨාපනය කිරීමද අත්‍යවශ්‍යවේ. ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂාකාරී සහ දැරිය හැකි මිලකට පානීය ජලය ලබාදීම සහතික කිරීමට මූලික අවශ්‍යතාවයන්හි අඩුපාඩු පවතින මිලියන 800 ක ජනතාවක් වෙත ප්‍රවේශ විය යුතු අතරම බිලියන දෙකකට අධික ජනකායකට ආරක්ෂිත ලෙස සේවාවන් වෙත ළඟාවීමට ඇති අවස්ථාව වැඩිදියුණු කළ යුතුය.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%-100 % |
| 6 CLEAN WATER AND SANITATION | පිරිසිදු ජලය සහ සනීපාරක්ෂක පහසුකම් | සැමටආරක්ෂාකාරී සහ දැරිය හැකි මිලකට පානීය ජලය සඳහා පොදු සහ සාධාරණ ප්‍රවේශය සැලසීම සාක්ෂාත් කරගැනීම | දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය මඟින් පෙර පාසල් 03 ක වැසිකිලි ඉදිකිරීම සහ ජල පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතිය | - | - | 3 |
| | | ගොවිතැන් කටයුතු සඳහා භූගත ජල ධාරිතාව වැඩිදියුණු කිරීම සහ කුඩා ජලාශවල ජල ධාරිතාවය වැඩි කිරීම | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මඟින් කුඩා ජලාශ 09 ක් අළුත්වැඩියා කිරීම හෝ ජල ධාරිතාවය වැඩි කිරීම | - | - | 9 |
| | | සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රමාණවත් සහ සාධාරණ ප්‍රවේශය සැලසීම සාක්ෂාත් කරගැනීම | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මඟින් වැසිකිලි 05 ක් ඉදිකිරීම | - | - | 05 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | සැමටආරක්ෂාකාරී සහ දැරිය හැකි මිලකට පානීය ජලය සඳහා පොදු සහසාධාරණ ප්‍රවේශය සැලසීම සාක්ෂාත් කරගැනීම. ප්‍රතිලාභීන් 958 ක් සඳහා ජල පහසුකම් ලබාදීම | ජාතික සමඟිය හා සංහිඳියා කාර්යංශය මඟින් සාමාන්‍ය විවෘත ළිං 09 ක් ඉදිකිරීම | - | 09 | - |
| | | සැම අංශයකම ජල පරිහරණ කාර්යක්ෂමතාවය ප්‍රමාණවත් තරම් වර්ධනය කිරීම. ප්‍රතිලාභීන් 650 ක් සඳහා පානීය නල ජල පහසුකම් සැපයීම. | ජාතික සමඟිය හා සංහිඳියා කාර්යංශය මඟින් ප්‍රධාන ජල සැපයුමේ විස්තාරණ මාර්ගය සංවර්ධනය කිරීම | - | 01 | - |
| | | දූෂණය අඩු කරමින් ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම. පාසල් සිසුන් 290 දෙනකු සඳහා පිරිපහදු කරන ලද පානීය ජලය ලබාදීම. | ජාතික සමඟිය හා සංහිඳියා කාර්යංශය මඟින් පාසල් සඳහා RO ජල පිරිපහදු පද්ධති03 ක් ක්‍රියාත්මක කිරීම | - | - | 03 |
| | | සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රමාණවත් සහ සාධාරණ ප්‍රවේශය සැලසීම සාක්ෂාත් කරගැනීම | නැවත පදිංචි කිරීමේ අමාත්‍යංශය මඟින් සනීපාරක්ෂක පහසුකම් 300 ක් ලබාදීම / වැසිකිළි 300 ක් ඉදිකිරීම | - | 06 | 294 |
| | | සැමටආරක්ෂාකාරී සහ දැරිය හැකි මිලකට පානීය ජලය සඳහා පොදු සහසාධාරණ ප්‍රවේශය සැලසීම සාක්ෂාත් කරගැනීම | නැවත පදිංචි කිරීමේ අමාත්‍යංශය මඟින් පුද්ගලික ජල සම්බන්ධතා 864 ක් ලබාදීම | 83 | - | 781 |
| | | සැම අංශයකම ජල පරිහරණ කාර්යක්ෂමතාවය ප්‍රමාණවත් තරම් වර්ධනය කිරීම, තිරසර ඉවත්කර ගැනීම සහතික කිරීම සහ ජල හිගයට පිළියම් ලෙස අභ්‍යන්තර ජලාශවලින් ජලය සැපයීම සහ ජල හිගයෙන් පීඩාවට පත්ව සිටින පුද්ගලයින් සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීම. | මුදල් අමාත්‍යංශය මඟින් වැව්, පොකුණු සහ ඇල මාර්ග අළුත්වැඩියා කිරීම කිරීම | 1 | 1 | 4 |

**සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම**

ජනගහනය වර්ධනය වීම මේ දක්වාම සිදුවන හෙයින් ලාභදායී බලශක්තිය සඳහා වන ඉල්ලුම සහ ෆොසිල ඉන්ධන මත පදනම්වූ ආර්ථිකයක් පැවතීම හේතුවෙන් අපගේ දේශගුණ තත්වයන්හි ප්‍රභල විපර්යාසයන් නිර්මාණය වෙමින් පවතී. වර්ෂ 2030 වන විට තිරසර සංවර්ධන ඉලක්ක අංක 7 (SDG7) සාක්ෂාත් කරගැනීමටනම්සූර්ය, සුළං සහ තාප බලශක්තිය යනාදිය සඳහා ආයෝජනය, බලශක්ති ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සහ සැමට බලශක්තිය ලැබීම සහතික කිරීම යන කරුණු ඉතා වැදගත්වේ. සෑම රාජ්‍යයකම පිරිසිදු සහ වඩාත් කාර්යක්ෂම බලශක්තිය සැපයීම සඳහා යටිතල පහසුකම් පුළුල් කිරීම සහ තාක්ෂණය උසස් කිරීම මඟින් දියුණුව සඳහා අනුබල දීම සහ පරිසරය සුරැකීම.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%-100% |
| 7 CLEAN ENERGY | දැරිය හැකි, සහ පවිත්‍ර ඉන්ධන | අපගේ අවශ්‍යතා සඳහා වන දැරිය හැකි මිලකට, විශ්වාසනීය සහ නවීන බලශක්ති සේවා වෙත ප්‍රවේශය තහවුරු කිරීම | කර්මාන්ත හා වාණිජ, දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය මඟින් වීදි ලාම්පු 15 ක් සැපයීම | - | 8 | 7 |
| | | | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මඟින් 359 දෙනකු වෙත විදුලි බල සැපයුම් ලබාදී ඇත. | 154 | - | 205 |
| | | සැමට දැරිය හැකි මිලකට, විශ්වාසනීය සහ නවීන බලශක්ති සේවා වෙත ප්‍රවේශය තහවුරු කිරීම | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින්විදුලි බල ව්‍යාපෘති 13 ක් සම්පූර්ණ කර ඇත. | - | - | 13 |

## සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම

තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) මඟින් පෝෂිත ආර්ථික වර්ධනය, ඉහළ මට්ටමේ ඵලදායීතාව සහ තාක්ෂණික නව්‍යකරණය ප්‍රවර්ධනය කරයි. මෙහිදී බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම, වහල් සේවය සහ මිනිස් ජාවාරම දුරුකිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම ආදිය මෙන්ම ව්‍යවසායකත්වය සඳහා අනුබල දීම සහ රැකියා උත්පාදනයද වැදගත් වේ. මෙම අරමුණු සිහිතබා ගනිමින් වර්ෂ 2030 වන විට ස්ත්‍රී පුරුෂ සැම අයකුටම සම්පූර්ණ සහ ඵලදායී රැකියාවක් හා යෝග්‍ය කාර්යයන් ලබාදීම සාක්ෂාත් කරගැනීම මෙහි ඉලක්කයයි.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| | යහපත් රැකියා සහ ආර්ථික වර්ධනය | විශේෂයෙන්ම කාන්තා ගෘහ මූලික පවුල්වල ජීවන තත්වය වැඩිදියුණු කිරීම, කාන්තාවන් සඳහා රැකියා අවස්ථා සහ ආදායම් මාර්ග සලසා දීම, ජනතාවගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම සහ ඔවුන්ට සතුටුදායක ජීවිතයක් ලබාදීම. | කර්මාන්ත හා වාණිජ, දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය මඟින් මධ්‍යස්ථාන 15 ක් සඳහා මහන මැෂින් නිකුත් කිරීම - 2019 වර්ෂයේ මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රතිපාදන ලබාදුන් සහ අනුමත ව්‍යාපෘති | 2019 පෙබ – මාර්තු | 2019 අප්‍රේල් - මැයි | 2019 ජූනි |
| | | තරුණ තරුණියන්, ආබාධිත අයවළුන් ඇතුළු ස්ත්‍රී පුරුෂ සැම අයකුටම සම්පූර්ණ සහ ඵලදායී රැකියාවක් හා යෝග්‍ය කාර්යයන්, සහ සමාන වටිනාකම් ඇති වැඩ සඳහා සමාන ගෙවීම් ලබාදීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම. | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, උතුරු පලාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් වෘත්තීය සහ ජීවනෝපාය මාර්ග ව්‍යාපෘති 6 ක් ක්‍රියාත්මක කිරීම | - | - | 6 |
| | | | ඉන්දියාවේ සිට නැවත මෙරටට පැමිණි සරණාගත පවුල් 157 ක් සඳහා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මඟින් නැවත පදිංචි කිරීමේ ආධාර ලබාදීම. | - | - | 156 |

## සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම

ආර්ථික වර්ධන ය්දී සහ සංවර්ධනයේදී යටිතල පහසුකම් මත ආයෝජනය සහ නව්‍යකරණය යන කරුණු තීරණාත්මක සාධකවේ. මේ වන විට ලෝක ජනගහනයෙන් අඩකට වඩා නගරවල ජීවත් වීමත් සමඟ නව කර්මාන්තයන් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වර්ධනය මෙන්ම මහා පරිමාණයේ ප්‍රවාහනය සහ පුනර්ජනනීය බලශක්තියද වඩාත් වැදගත් වෙමින් පවතී. නව රැකියා අවස්ථා ලබාදීම සහ බලශක්ති ඵලදායීතාවය ප්‍රවර්ධනය ආදී ආර්ථික සහ පාරිසරික යන අභියෝග ද්විත්වය සඳහාම නිත්‍ය විසඳුම් සෙවීමේදී තාක්ෂණික ප්‍රගතියද මූලිකවේ. තිරසර කර්මාන්ත ප්‍රවර්ධනය සහ විද්‍යාත්මක පර්යේෂණ හා නව්‍යකරණයන් සඳහා ආයෝජනය යන සියල්ලක්ම තිරසර සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා වැදගත් වේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| | කර්මාන්ත, නව්‍යකරණය සහ යටිතල පහසුකම් | සැමට සමාන සහ දැරිය හැකි මිලකට ප්‍රවේශය කේන්ද්‍රීත ලෙස ආර්ථික සංවර්ධනය සහ මානව යහ පැවැත්මට රුකුලක් වන ප්‍රාදේශීය සහ පරිවාහක යටිතල පහසුකම්ද ඇතුළුව ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහ සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, උතුරු පලාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින්යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් 06 ක් සම්පූර්ණ කිරීම | - | - | 6 |
| | | වෙනත් කරුණු අතර කාර්මික විවිධාංගිකරණය සහ පාරිභෝගික භාණ්ඩ සඳහා අගය එකතු කිරීම සහතික කෙරෙන සංවර්ධක ප්‍රතිපත්තිමය රාමුවක් තුළ දේශීය තාක්ෂණය සංවර්ධනය, සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් තුළ පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා සහය වීම | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, උතුරු පලාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 58 ක් සම්පූර්ණ කිරීම (ප්‍රජා ශාලා, ආගමික ස්ථාන සහ ක්‍රීඩා පිටි) | - | - | 58 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | වර්ෂ 2020 වන විට ඌණ සංවර්ධිත රාජ්‍යයන් සඳහා ගෝලීය සහ දැරිය හැකි මිලකට අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් සැපයීමට කැපවීම සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ප්‍රවේශය සැළකිය යුතු තරම් ඉහළ නැංවීම. | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, උතුරු පලාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් සමිති 144 ක් සඳහා ගෘහ භාණ්ඩ සහ උපකරණ ලබාදීම. | - | - | 144 |
| | | මාර්ගයන් වෙත පහසු ප්‍රවේශය වැඩිදියුණු කිරීම. | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මඟින් අභ්‍යන්තර මාර්ග 88 ක් අළුත්වැඩියා කිරීම කිරීම | 15 | 3 | 208 |
| | | ආර්ථික සංවර්ධනය, මානව යහ පැවැත්ම සහ සැමට සමාන අවස්ථා සැලසීමට රුකුලක් ලෙස ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහසවිමත් ලෙස යටිතල පහසුකම් සංවර්ධනය කිරිම | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රීඩා පිටි 104 ක්, සති පොල ගොඩනැගිලි 2 ක් සහ ළමා උද්‍යාන 22 ක් අළුත්වැඩියා කිරීම කිරීම | 8 | 1 | 119 |
| | | ග්‍රාමීය ප්‍රදේශ වෙත යහපත් ප්‍රවාහන පහසුකම් ලබාදීම මඟින් කුඩා පරිමාණයේ කර්මාන්ත සහ අනෙකුත් ව්‍යවසායන් සඳහා අවශ්‍ය සම්බන්ධතා වැඩිදියුණු කර දීම සහ ප්‍රධාන මාර්ගයක සිට කිලෝ මීටර 2 ක දුරක් ඇතුලත ජීවත් වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය ඉහළ නැංවීම. | ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය මඟින් අතුරු මාර්ග 19 ක් අළුත්වැඩියා කිරීම කිරීම - DAP | 02 | 03 | 14 |
| | | සංවර්ධනය වන රටවල්වල තිරසර හා සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම. | ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය මඟින් ප්‍රජා ශාලා 02 ක් ඉදිකිරීම - DAP | - | - | 02 |
| | | ආර්ථික සංවර්ධනය, මානව යහ පැවැත්ම සහ සැමට සමාන ප්‍රවේශය සඳහා රුකුලක් වන ලෙස ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහ සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මඟින් යටිතල පහසුකම් ආශ්‍රිත ව්‍යාපෘති ලබාදී ඇත. | - | - | 05 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ආර්ථික සංවර්ධනය සහ මානව යහ පැවැත්මට රුකුලක් වන ප්‍රාදේශීය සහ පරිවාහක යටිතල පහසුකම්ද ඇතුළුව ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහ සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | සංචාරක සංවර්ධන අමාත්‍යාංශය මගින් කිලෝමීටර 6.0 ක අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම | - | 60% | - |
| | | ආර්ථික සංවර්ධනයට රුකුලක් වන ප්‍රාදේශීය සහ පරිවාහක යටිතල පහසුකම්ද ඇතුළුව ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහ සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | කර්මාන්ත හා වාණිජ, දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය මගින් අභ්‍යන්තර මාර්ග, ආගමික ස්ථාන සහ පොදු ශාලා 178 ක ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු කිරීම | 36 | 5 | 137 |
| | | ප්‍රාදේශීය සහ පරිවාහක යටිතල පහසුකම්ද ඇතුළුව ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහ සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | මුදල් අමාත්‍යාංශය මගින් මාර්ග 37 ක් RIDP | 6 | 3 | 28 |
| | | ආර්ථික සංවර්ධනය, මානව යහ පැවැත්ම සහ සැමට සමාන ප්‍රවේශය සඳහා රුකුලක් වන ලෙස ගුණාත්මක, විශ්වාසනීය, තිරසර සහ සවිමත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | මුදල් අමාත්‍යාංශය මගින් වී ගබඩා අළුත්වැඩියා කිරීම - RIDP | - | - | 1 |

## රටවල් තුල සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම

ආදායම් විශමතාවය මෑත දශකවලදී සෑම ප්‍රදේශයකම පාහේ විවිධ වේගයන් ගත් වර්ධනයවී ඇත. මෙකී පුළුල් වන විෂමතාවය දුරලීමට අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ භාවය හෝ වාර්ගිකත්වය නොතකා සියල්ලන්ම ඇතුලත් වන ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීම සඳහා වන ස්ථිර ප්‍රතිපත්ති අවශ්‍යවේ. එමෙන්ම ආදායම් විශමතාවය දුරලීම සඳහා ගෝලීය විසඳුම් අවශ්‍ය වන අතර එහිදී මූල්‍ය වෙළඳපල හා මූල්‍ය ආයතනයන් නියාමනය සහ ආවේක්ෂණය වැඩිදියුණු කිරීම, සංවර්ධන ආධාර සඳහා අනුබල දීම හා වැඩි අවශ්‍යතාවයක් ඇති ප්‍රදේශ වෙත ඍජු විදේශීය ආයෝජන යොමු කිරීම ආදිය සම්බන්ධවේ. පුළුල් වමින් පවතින මෙම අසමානතාවය දුරලීම සඳහා ආරක්ෂාකාරී සංක්‍රමණයට සහ මිනිස් සංචරණයට පහසුකම් සැලසීම වැදගත්වේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | **0% - 49%** | **50% - 74%** | **75%- 100%** |
| | අසමානතාවය අඩු කිරීම | ජාති, ජනවර්ග, සම්භවය, ආගම් හෝ වෙනත් තත්වයන් නොතකා සියල්ලන්ම සමාජීය, ආර්ථික හා දේශපාලන කටයුතුවලට සහභාගීත්වයබලගැන්වීම සහ දියුණු කිරීම | ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය ආගමික ස්ථාන 35 ක් අළුත්වැඩියා කිරීම - DAP | 03 | 13 | 16 |
| | | ආගමික ස්ථාන ගොඩනැගීම තුලින් සමාජ සමාජ සංහිදියාව ඇතිකිරිම. | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මඟින් අධ්‍යාත්මික ක්‍රියාකාරකම් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම | - | - | 01 |
| | | | කර්මාන්ත හා වාණිජ, දීර්ඝ කාලීනව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම්, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය මඟින් ආගමික ස්ථාන 10 ක ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු කිරීම සහ ග්‍රාමීය සංවර්ධන සමිති හා කාන්තා ග්‍රාමීය සංවර්ධන සමිති 58 ක් සඳහා ගෘහ භාණ්ඩ ලබාදීම | 3 | 5 | 60 |
| | | යහපත් ප්‍රජාවක් ගොඩනැගීම සඳහා සමාජීය, ආර්ථික හා ආගමික අංශ බලගැන්වීම සහ දියුණු කිරීම | මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මඟින් ආගමික ස්ථාන 504 ක් අළුත්වැඩියා කිරීම | 9 | 1 | 494 |

## නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් තිරීම

නගරයන්හි ශීඝ්‍ර වර්ධනය ඉහල යන ජනගහනය සහ අධික සංක්‍රමණයන්ගේ ප්‍රතිඵලයක් වන අතර එය මහා නගර බිහිවීමට හේතුවී ඇත. එහිදී විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ මුඩුක්කු ජනාවාස නාගරික ජීවිතයේ සැලකිය යුතු අංගයක් බවට පත්ව තිබේ. තිරසර ලෙස නගර සකස් කිරීම යනු වෘත්තීය සහ ව්‍යාපාර අවස්ථා නිර්මාණය කිරීම, දැරිය හැකි මිලකට ආරක්ෂාකාරී නිවාස සැපයීම සහ ශක්තිමත් සමාජයන් හා ආර්ථිකයක් ගොඩනැගීමයි. එහිදී පොදු ප්‍රවාහනය හා හරිත පොදු අවකාශ නිර්මාණය සඳහා ආයෝජන කිරීම සහ සහභාගීත්ව හා පරිපූර්ණ ලෙස නගර සැලසුම් වැඩිදියුණු කිරීම සහ කළමනාකරණයද ඇතුලත්වේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%-100% |
| | තිරසර නගර සහ ප්‍රජාවන් | ගෝලීය සංස්කෘතික හා ස්වභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා සුරක්ෂිත කිරීමේ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම. | සංචාරක කටයුතු අමාත්‍යංශය මඟින් තේක්කම්හි කුන්චුකුලම් එල්ලෙන පාලම අළුත්වැඩියා කිරීම | - | - | 01 |
| | | සැමටම ප්‍රමාණවත්, ආරක්ෂිත හා දැරිය හැකි මිලකට නිවාස පහසුකම් ලබාගැනීමේ ප්‍රවේශයන් සහතික කිරීම. | නැවත පදිංචි කිරීමේ අමාත්‍යංශය මඟින් නිවාස 1210 ක් ඉදිකිරීම | 238 | 450 | 522 |
| | | | මුදල්, ආර්ථික කටයුතු සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යංශය මඟින් නිවාස 24 ක් අළුත්වැඩියා කිරීම | 1 | - | 23 |
| | | ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් ශක්තිමත් කරමින් නාගරික, අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ අතර ධනාත්මකආර්ථික, සමාජීය හා පාරිසරික සම්බන්ධතා සඳහා උපකාර කිරීම. | මුදල් අමාත්‍යංශය මඟින් ප්‍රජා ශාලා ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම | - | - | 10 |

## තිරසර සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම හා ගෝලීය හවුල්කාරීත්වය පුනර්ජීවනය කිරීම

වත්මන්ලෝකය අන් කවරදාකටත් වඩා එකිනෙකට සම්බන්ධවී පවතී. තාක්ෂණය සහ දැනුම සඳහා වන ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම අදහස් බෙදාහදා ගැනීම සහ නව්‍යකරණය පෝෂණය කිරීමේදී වැදගත් මාර්ගයක්වේ. ඌණ සංවර්ධිත රාජ්‍යයන් වෙත ආයෝජන ලබාගැනීම ප්‍රවර්ධනය මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්ට ඔවුන්ගේ ණය කළමනාකරණය සඳහා උපකාරීවන ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීමද තිරසර වර්ධනය සහ සංවර්ධනය සඳහා ඉතා වැදගත්වේ. ඉලක්ක සියල්ල සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම්වලට උපකාර කරමින් සහයෝගයන් වැඩිදියුණු කිරීම මෙම අභිමතාර්ථවල අරමුණවේ. ජාත්‍යන්තර වෙළඳාම් කටයුතු ප්‍රවර්ධනය සහ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්ට ඔවුන්ගේ අපනයන වැඩිකර ගැනීමට උපකාර කිරීම ආදී සියල්ලක්ම සැමට ප්‍රතිලාභ හිමිවන, විවෘතවූද, සමානවූද ජාත්‍යන්තර රීති මත පදනම්වූ සාධාරණ වළඳ ක්‍රමයක් සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලියේ කොටස්වේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| | ඉලක්ක සඳහා සම්බන්ධතාව යන් | තිරසර සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම හා ගෝලීය හවුල්කාරීත්වය පුනර්ජීවනය කිරීම. | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම, උතුරු පලාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යංශය මඟින් ග්‍රාමීය ප්‍රවේශ ව්‍යාපෘති 5 ක් සම්පූර්ණ කර ඇත. | - | - | 5 |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග




ඉහත විස්තර කරන ලද එක් එක් ව්‍යාපෘතිය නිශ්චිත ව්‍යාපෘති කාලසීමාවන් ඇතුලත ක්‍රියාත්මක කිරීම තුලින් ප්‍රතිලාභීන් විසින් පහත ප්‍රතිලාභ අත්විදිනු ඇත. රැකියා අවස්ථා සහ ආදායම් වැඩිකිරීම, දිළිදුබව අවම කිරීම, ජීවන තත්වය වැඩිදියුණු කිරීම හා අභ්‍යන්තර මාර්ග සහ ප්‍රජා ශාලා අළුත්වැඩියා කිරීම.ජනතාවගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් ජීවනෝපාය මාර්ග උපකරණ සහ ණය මුදල් ලබාදී ඇත.




මරණය මෙන්ම ලෙඩ රෝග සඳහාද මූලික වන ප්‍රධාන හේතූන් රැසක් මර්දනයේලා අප විසින් විශාල ප්‍රගතියක් අත්කරගෙන ඇත. ආයු අපේක්ෂාව විශාල වශයෙන් ඉහල ගොස් ඇති අතර මාතෘ මරණ සහ ළමා මරණ අනුපාතයද අඩුවී ඇත. 2030 වර්ෂයේ න්‍යාය පත්‍රය මගින් මෙම සාධක දෙකෙහි අන්තර් සම්බන්ධතාවය සහ සංකීර්ත්වය පිළිඹිබු කරයි.




**පාසල් සංවර්ධන කටයුතු :**ගුණාත්මක අධ්‍යාපනයක් සැපයීමට යෝග්‍ය අධ්‍යාපනික පරිසරයක් නිර්මාණය කිරීමේ අදිටනින් ජාතික සමගිය හා සංහිදියා කාර්යංශය මගින්පාසලක සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 0.9 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් පාසැල් අළුත්වැඩියා කිරීම මගින් යෝග්‍ය අධ්‍යාපනික පරිසරයක් සකස් කර ඇති අතර එමගින් ගුණාත්මක අධ්‍යාපනයකට රුකුලක් සැපයේ.

ජාතික ආර්ථිකයට දායක කර ගැනීමේ අදිටනින්, නැවත පදිංචි කිරීම් සිදුකළ ප්‍රදේශවල ජනතාවගේ මූලික අවශ්‍යතා සහ යටිතල පහසුකම් ලබාදී ඔවුන් සවිමත් කර ඇත. නැවත පදිංචි කිරීම් සිදුකළ පසුව එම අමාත්‍යාංශය විසින් එම ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවීම සඳහා වන ක්‍රියාකාරකම් වේගවත් කර ඇත. මෙම සෑම ව්‍යාපෘතියකම මූලික අරමුණ වන්නේ ජාතික ආර්ථිකයට දායක වීම සහ සහය වීමයි. එමගින් අප රටේ අනාගත ආර්ථික වර්ධනයට රුකුලක් ලැබෙනු ඇත. අවසානයේදී සෑම ව්‍යාපෘතියක්ම එමගින් අපේක්ෂිත අවශ්‍යතා සැපිරීම සහතික කරයි. ජල සම්බන්ධතා සැපයීම, ජලාශ ප්‍රතිසංස්කරණය සහ සාමාන්‍ය විවෘත ළිං සකස් කිරීම ආදිය දැරිය හැකි මිලක් වන සහ ආරක්ෂාකාරී වන පානීය ජලය වෙත ගෝලීය වශයෙන් සැමට ප්‍රවේශය සහතික කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට සහයක්වේ.







ජනගහනය වර්ධනය වීම මේ දක්වාම සිදුවන හෙයින්, ලාභදායී ඉන්ධන සඳහා වැඩි ඉල්ලුමක් පවතී.සූර්ය, සුළං සහ තාප බලශක්තිය යනාදිය සඳහා ආයෝජනය, බලශක්ති ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සහ සැමට බලශක්තිය ලැබීමට උපකාරීවේ.

8 DECENT WORK AND ECONOMIC GROWTH

ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් නැවත යථා තත්වයට පත්වෙමින් තිබේ. වර්ධනය වන විශමතාවයන් දුරලීමට තරම් ප්‍රමාණවත් රැකියා අවස්ථා නොමැත. තිරසර සංවර්ධන ඉලක්ක (SDG) මගින් එම ඉලක්කද සමග පෝෂිත ආර්ථික වර්ධනය, ඉහල මට්ටමේ ඵලදායීතාවය සහ තාක්ෂණික නව්‍යකරණය යන කරුණු ප්‍රවර්ධනය කරන අතරම වර්ෂ 2030 වන විට ස්ත්‍රී පුරුෂ සැම අයකුටම සම්පූර්ණ සහ ඵලදායී රැකියාවක් හා යෝග්‍ය කාර්යයන් ලබාදීම සාක්ෂාත් කර ගැනීමේ ඉලක්කය මූලික කර මෙම කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි.

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

ග්‍රාමීය ප්‍රදේශ වෙත මනා ප්‍රවාහන පහසුකම් ලබාදී කුඩා පරිමාණයේ කර්මාන්ත සහ අනෙකුත් ව්‍යවසායන් සඳහා වන සම්බන්ධතාවයන් වර්ධනය කිරීම.තවද පොදු අවශ්‍යතා සඳහා වන ගොඩනැගිලි ඉදිකිරීම මගින්ද තිරසර හා සවිමත් යටිතල පහසුකම් සංවර්ධනයකට පහසුකම් සැලසේ.
යටිතල පහසුකම් සංවර්ධන කටයුතු, ක්‍රීඩා පිටි අළුත්වැඩියා කිරීම් (104), ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති, ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය (107) සහ ප්‍රජා ශාලා ඉදිකිරීම් තුලින් කර්මාන්ත, නව්‍යකරණය සහ යටිතල පහසුකම් යන අංශ වලට රැකුලක් ලැබේ.

10 REDUCED INEQUALITIES

ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය මගින් ආගමික ස්ථාන 35 ක් අළුත්වැඩියා කර ඇති අතර මුදල් අමාත්‍යාංශය මගින් ආගමික ස්ථාන 504 ක් අළුත්වැඩියා කර ඇත. මේ ආකාරයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අරමුණ වන්නේ සමාජ ඒකාබද්ධතාවය සහ සමාජ සංහිදියාව ගොඩනැගීමයි.

11 SUSTAINABLE CITIES AND COMMUNITIES

මන්නාරම දිස්ත්‍රික්කයේ සංචාරක කටයුතු සංවර්ධනය සඳහා රුකුලක් වන ලස සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ය් දායකත්වයෙන් රු.මිලියන 2.37 ක මූල්‍ය ප්‍රතිපාදන යොදා ගනිමින් කුන්චුකුලම් එල්ලෙන පාලම අළුත්වැඩියා කිරීමේ කටයුතු සාර්ථකව අවසන් කර ඇත.

17 PARTNERSHIPS FOR THE GOALS

තිරසර සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම හා ගෝලීය හවුල්කාරීත්වය පුනර්ජීවනය කිරීමේ අරමුණ ශක්තිමත් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ග්‍රාමීය ප්‍රවේශ ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කර ඇත.

# 6. 06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 13 | 8 | 5 |
| තෘතීයික | 4 | 1 | 3 |
| ද්විතීයික | 60 | 52 | 8 |
| ප්‍රාථමික | 24 | 20 | 4 |
| **එකතුව** | **101** | **81** | **20** |

## 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා තනතුරු දෙකක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා තනතුරු පහක් ලෙස කාර්මික නිලධාරී තනතුරු හතක් අනුමත කර තිබුණද දැනට කිසිදු කාර්මික නිලධාරියකු අනුයුක්ත කර නොමැත. එම නිසා එක් ඉංජිනේරුවරයකු විසින් කාර්මික සහකාරවරයකුගේ සහය ඇතිව ඇස්තමේන්තු සකස් කිරීම, වැඩ අධීක්ෂණය, ටෙන්ඩර් කාර්ය පටිපාටි සහ බිල්පත් පරීක්ෂා කිරීම ආදී සියළු කටයුතු සිදුකරනු ලබයි. මෙම තත්වය හේතුවෙන් එක් එක් සංවර්ධන ක්‍රියාකාරකමක්ම නියමිත කාල රාමුව තුල අධීක්ෂණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේදී විශාල වැඩ කොටසක් කිරීමට සිදුව තිබේ.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා සිංහල - දෙමළ භාෂා පරිවර්තන සේවයේ නිලධාරී තනතුරු හයක් අනුමත කර තිබුණද මේ දක්වාම එම සේවයේ කිසිදු නිලධාරියකු අනුයුක්ත කර නොමැත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහේම කාර්ය සාධනය සහ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා සිංහල - දෙමළ භාෂා පරිවර්තන කටයුතු අවශ්‍ය වන අතර එය සේවාලාභීන්ගේ තෘප්තිය සඳහාද රැකුලක් වනු ඇත.

- සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරක පුරප්පාඩුවක් පවතින බැවින් එක් නිලධාරියකු හට තනතුරු දෙකක රාජකාරි ආවරණය කිරීමට සිදුව ඇත. එකි ප්‍රතිඵලයක් ලෙස එක් එක් සංවර්ධන ක්‍රියාකාරකමක්ම නියමිත කාල රාමුව තුල අධීක්ෂණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේදී විශාල වැඩ කොටසක් කිරීමට සිදුව තිබේ.

- මන්නාරම නගරය සහ මාන්තෙයි බටහිර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහිම ස්ථිර ප්‍රාදේශීය ලේකම්වරුන් නොමැති බැවින් එම කාර්යාල වලට අනුයුක්ත සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම් තනතුරු වල රාජකාරි ආවරණය කරනු ලබයි. මෙම නිසා එක් නිලධාරියකු හට තනතුරු දෙකක රාජකාරි ඉටු කිරීමට සිදුව ඇත.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු '000) | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | **දේශීය** | **විදේශීය** | | |
| CIGAS | 40 | දින 1 යි | 25,850 | - | දේශීය | CIGAS පිළිබඳ නව දැනුම වර්ධනය කිරීම |
| දූෂණ සඳහා කිසිදු සහනයක් ලබ නාදීම | 40 | දින 1 යි | - | - | දේශීය | දූෂණ පිළිබඳව හා එය වැළැක්වීම පිළිබඳව දැනුවත් වීම |
| තිරසර විසඳුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා දිස්ත්‍රික් නිලධාරීන්ට සහය වීම | 210 | දින 1 යි | 95,360 | - | දේශීය | තිරසර විසඳුම් පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| රාජ්‍ය අංශයේ දූෂණ වැළැක්වීමේ වැඩසටහන | 103 | දින 1 යි | 38,000 | - | දේශීය | දූෂණ පිළිබඳව දැනුවත් වීම |
| වාර්තා ලිවීම | 60 | පැය 3 යි | 10,525 | - | දේශීය | වාර්තා ලිවීම පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| ඉඩම් විෂයය | 76 | දින 2 යි | 45,422 | - | දේශීය | ඉඩම් විෂයය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි | 73 | දින 2 යි | 37,177 | - | දේශීය | ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසිපිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| පරිගණක පුහුණුව (SYSSCA) | 14 | පැය 3 යි | 3,250 | - | දේශීය | පරිගණකපිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| වබ් අඩවි යාවත්කාලීන කිරීමේ පුහුණුව | 25 | දින 1 යි | 11,987 | - | දේශීය | වබ් අඩවි යාවත්කාලීන කිරීම පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| රජයේ විනය කාර්ය පටිපාටිය | 48 | දින 2 යි | 51,511 | - | දේශීය | රජයේ විනය කාර්ය පටිපාටියපිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| සමෝධානික සංවර්ධන වැඩසටහන් පිළිබඳධාරිතා වර්ධන පුහුණුව | 120 | දින 1 යි | 105,590 | - | දේශීය | සමෝධානික සංවර්ධනය සහ තිරසර සංවර්ධනයපිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| පරිගණක වැඩසටහන | 30 | දින 4 යි | 80,800 | - | දේශීය | පරිගණක දැනුම ලබා ගැනීම |
| අළුතින් බඳවාගත් උපාධිධාරී රැකිය පුහුණුවන්නන් සඳහාවූ හඳුන්වාදීමේ වැඩසටහන | 120 | දින 1 යි | 104,613 | - | දේශීය | පරිපාලන සහ මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම ලබා ගැනීම |
| තාර්කික රාමු ප්‍රවේශය පිළිබඳ පුහුණුව | 20 | දින 2 යි | 15,550 | - | දේශීය | තාර්කික රාමු ප්‍රවේශය පිළිබඳ තේරුම් ගැනීම සහ ඒ පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම |

## 7. 07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාල නොවේ | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014-05-11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීම | අනුකූල නොවේ | ජීවනෝපාය ආධාර සම්බන්ධ දත්ත එක්රැස් කිරීම ප්‍රමාද වීම | මෙවන් ප්‍රමාදයන් වලක්වා ගන්නා ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | නියමිත වේලාවන් හිදී ප්‍රදේශිය ලේකම් කාර්යාල විගණන හා කළමනාකරණ ක මිටු රැස්වීම් නොපැවැත්වීම | සිහිකැඳවීම් මඟින් සති දෙකක් ඇතුලත පිළිතුරු ලබාගැනීමට කටයුතු කිරීම සහ නියමිත වේලාවන් හිදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සඳහා නියමිත වේලාවට පිළිතුරු සැපයීමට අපොහොසත් වුවහොත් දිස්ත්‍රික් ලේකම් / දිසාපති හරහා පියවර ගැනීම. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | - | - |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච් ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය, ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂිකභාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | - | - |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| 9.5 | 2016-12-29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | - | - |
| **10** | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අදාල නොවේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයත් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | අදාල නිලධාරියාට එරෙහිව අධිකරණයේ නඩු පවරා ඇත. | අනාගතයේදී මෙවන් දෝශ ඇති නොවන ලෙස කටයුතු කළ යුතු බවට අදාල නිලධාරීන්ට දැඩි ලෙස උපදෙස් ලබාදී ඇත. අභ්‍යන්තර පරීක්ෂා කිරීම් සහ අභ්‍යන්තර පාලනය දැඩිව ක්‍රියාත්මක කර ඇත. |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසාන ය් දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළැඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ නිල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | සේවයෙන් ඉවත් කිරීම සහ වැඩ තහනම් කිරීම | ආපසු අය කර ගැනීම සඳහා පියවර ගෙන ඇත. |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | අනුකූල වේ | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයාට වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 16.3 | 20-09-2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018-01-24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට කර තිබීම. | අනුකූල වේ | - | - |